# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 158/11 — 1975 අප්‍රේල් 11 වැනි සිකුරාද — 1975.04.11**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී. 139/47

අංකය : පීසීසී ඒ 744/65.

### රේගු නිවේදනය (ගාස්තු වක්‍රය) අංක 75/1
රේගු ආඥාපනත

(235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව, 1975 මාර්තු මස 20 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේ දී ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ දිය,
1975.4.9 දින.

### යෝජනාව

" මෙ යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට, මෙහි වූ උපලේඛනයේ 2 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයේ 4 වැනි තීරයෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ, (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ " අ " උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අය කළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම්, එම උපලේඛනයේ 3 වැනි තීරයෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව රේගු ආඥාපනත යටතේ ආනයන තීරු ගාස්තු අය කළ යුතු බව හා ගෙවිය යුතු බව (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙම සභාව යෝජනා කරයි."

### උපලේඛනය

| ශීර්ෂ අංකය | ගාස්තු ශීර්ෂය | තීරුබදු ප්‍රමාණය | | සම්මත ජාත්‍යන්තර වර්ගීකරණය (ප්‍රතිශෝධිත) අංකය | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|
| | | වරණීය බද්ද | සාමාන්‍ය බද්ද | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) |
| 87.02 ... | පුද්ගලයින්, භාණ්ඩ හෝ ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමෙ මෝටර් වාහන (අංක 87.09 ශීර්ෂය යටතේ ගැනෙන ඒවා හැර විනෝද මෝටර් වාහන ඇතුළුව) | | | | |
| | (ඒ) මෝටර් කාර් සහ මෝටර් ස්ටේෂන් වැගන්— | | | | |
| | (1) ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද සැපයීම් කරුවන්ගෙන් ණය ලබා ගැනීමේ ක්‍රම හා අන් අනුමත කරන ලද විදේශීය ණය ලබාගැනීමේ ක්‍රම යටතේ සංචාරක රථ ක්‍රියාකරවන්නන් විසින් ආනයනය කරනු ලබන මෝටර් කාර් සහ මෝටර් ස්ටේෂන් වැගන් ; සහ සංචාරක ප්‍රවාහන රථ කණ්ඩායම් මෙහෙයවීමේ කාර්යය සඳහා ලංකා හෝටල් සංස්ථාවේ සහාය ඇතිව පිහිටුවන ලද වෙළඳ සමාගම් මගින් ආනයනය කරනු ලබන මෝටර් කාර් සහ මෝටර් ස්ටේෂන් වැගන් | — ... | 25% | ... 732.11 ... | ගණනින් |

| ශීර්ෂ අංකය (1) | ගාස්තු ශීර්ෂය (2) | තීරුබදු ප්‍රමාණය — වරණීය බද්ද (3) | තීරුබදු ප්‍රමාණය — සාමාන්‍ය බද්ද (4) | සම්මත ජාත්‍යන්තර වාණිජ්‍ය වර්ගීකරණය (ප්‍රතිශෝධිත) අංකය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|
| | (2) වෙනත්— | | | | |
| | (i) එකම වර්ගයේ හා එකම මාදිලි යක කවර හෝ වාහනයක් සම්බන්ධයෙන් මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු ආනයනය වරායට සේන්දු වන විට, රු. 7,500 නොඉක්මවන්නේ නම්— | 50% ... | 60% ... | 732.11 ... | ගණනින් |
| | (ii) එකම වර්ගයේ හා එකම මාදිලියේ කවර වාහනයක් සම්බන්ධයෙන් මිළ රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු, ආනයන වරායට සේන්දු වන විට රු. 7,500 ඉක්මවන්නේ වුවත්, රු. 10,000 නොඉක්මවන්නේ නම්— | මිල, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500න් 50% සහ ඊළඟ රු. 2,500න් හෝ ඉන් කොටසකින් 90% | මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500න් 60% සහ ඊළඟ රු. 2,500න් හෝ ඉන් කොටසකින් 100% | 732.12 ... | ගණනින් |
| | (iii) එකම වර්ගයේ හා එකම මාදිලි යක කවර හෝ වාහනයක් සම්බන්ධයෙන් මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු, ආනයන වරායට සේන්දු වන විට, රු. 10,000 ඉක්මවන්නේ වුවත් රු. 12,500 නොඉක්ම වන්නේ නම්— | මිළ රක්ෂණ, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500න් 50%, ඊළඟ රු. 2,500න් 90% සහ ඊළඟ රු. 2,500න් හෝ ඉන් කොටසකින් 190% | මිළ, රක්ෂණ, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500 න් 60%, ඊළඟ රු. 2,500න් 100%ක් සහ ඊළඟ රු. 2,500න් හෝ ඉන් කොටසකින් 200%ක් | 732.13 ... | ගණනින් |
| | (iv) එකම වර්ගයේ හා එකම මාදිලි යක කවර හෝ වාහනයක් සම්බන්ධයෙන් මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ආනයන ගාස්තු වරායට සේන්දු වන විට රු. 12,500 ඉක්මවන්නේ වුවත් රු. 15,625 නොඉක්මවන්නේ නම්— | මිළ, රක්ෂණ, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500න් 50%ක්, ඊළඟ රු. 2,500 න් 90%ක්, ඊළඟ රු. 2,500න් 190%ක් සහ ඊළඟ රු. 3,125න් හෝ ඉන් කොටසකින් 390%ක් | මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තු වලින් මුල් රු. 7,500න් 60%ක්, ඊළඟ රු. 2,500න් 100%ක් සහ ඊළඟ රු. 2,500න් 200%ක් සහ ඊළඟ රු. 3,125න් හෝ ඉන් කොටසකින් 400%ක් | 732.14 ... | ගණනින් |
| | (v) එකම වර්ගයේ හා එකම මාදිලි යක කවර හෝ වාහනයක් සම්බන්ධයෙන් මිළ, රක්ෂණය, ගැල් කුලී හා වෙනත් ගාස්තු ආනයන වරායට. සේන්දු වන විට, රු. 15,625 ඉක්මවන්නේ නම්— | මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තුවලින් මුල් රු. 7,500න් 50%ක්, ඊළඟ රු. 2,500න් 90%ක්, ඊලඟ රු. 2,500 න් 190%ක්, ඊළඟ රු. 3,125 න් 390%ක් සහ රු. 15,625 ඉක්මවන කවර හෝ මුදලකින් 590%ක් | මිළ, රක්ෂණය, ගැල්කුලී හා වෙනත් ගාස්තුවලින් මුල් රු. 7,500න් 60%ක්, ඊළඟ රු. 2,500න් 100%ක් ඊළඟ රු. 2,500න් 200%ක් ඊළඟ රු. 3,125න් 400%ක් සහ රු. 15,625 ඉක්මවායන කවර හෝ මුදලකින් 600% | 732 19 ... | ගණනින් |
| | (බී) පොදු සේවා වර්ගයේ මගීන් ගෙනයන වාහන (උදා. මෝටර් බස්, මෝටර් කෝච් ආදිය) | 17½% ... | 25% ... | 732.2 ... | ගණනින් |
| | (සී) මෝටර් වෑන් සහ ලොරි, ජීප් වර්ගයේ වාහන සහ අවමංගල රථ | 52½% ... | 60% ... | 732.3 ... | ගණනින් |
| | (ඩී) වෙනත් | 52½% ... | 60% ... | 732.3 ... | ගණනින් |

4–421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී